# පරිශිෂ්ටය 1

# ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

## මුදල් ප්‍රතිපත්තිය

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 30 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 7.50 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. |
| 2020 මාර්තු 17 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.25 සහ සියයට 7.25 දක්වා පදනම් අංක 25කින් අඩු කරන ලදී. |
| | - | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, 2020 මාර්තු 16 දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 5.00 සිට සියයට 4.00 දක්වා ප්‍රතිශතාංක 1.00කින් අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 03 | - | 2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 6.00 සහ සියයට 7.00 දක්වා පදනම් අංක 25කින් අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 16 | - | බැංකු අනුපාතිකය, සියයට 10.00 දක්වා පදනම් අංක 500කින් අඩු කළ අතර, පදනම් අංක +300ක ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීම සඳහා ඉඩ හරින ලදී. |
| 2020 මැයි 06 | - | 2020 මැයි මස 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුනපාතිකය, පිළිවෙළින්, සියයට 5.50 සහ සියයට 6.50 දක්වා පදනම් අංක 50කින් අඩු කරන ලදී. බැංකු අනුපාතිකය සියයට 10.00 සිට සියයට 9.50 දක්වා ස්වයංක්‍රීයව අඩු කරන ලදී. |
| 2020 ජූනි 16 | - | 2020 ජූනි 16 වන දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 දක්වා ප්‍රතිශතාංක 2.00කින් අඩු කරන ලද අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සඳහා වන මුදල් දායකත්වය සියයට 2.0 සිට සියයට 1.0 දක්වා අඩු කරන ලදී (මුදල් සහ නෝට්ටුවලින් සියයට 2කට වඩා වැඩියෙන් පවතින ප්‍රමාණයෙන් සියයට 1ක් පමණක් සංචිත ලෙස සලකනු ලැබේ). |
| 2020 ජූලි 09 | - | 2020 ජූලි මස 09 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 4.50 සහ සියයට 5.50 දක්වා පදනම් අංක 100කින් අඩු කරන ලදී. බැංකු අනුපාතිකය සියයට 9.50 සිට සියයට 8.50 දක්වා ස්වයංක්‍රීයව අඩු කරන ලදී. |

## විශේෂ ණය යෝජනා ක්‍රම

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 27 | - | වෙන් කරන ලද මුළු ප්‍රමාණය රුපියල් මිලියන 390 සිට රුපියල් මිලියන 950 දක්වාත්, ණය ගැනුම්කරුවකු සඳහා වන උපරිම ණය මුදල රුපියල් 500,000 සිට රුපියල් 1,000,000 දක්වාත් ඉහළ නැංවීම සඳහා ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - IIහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |

1 2020 ඔක්තෝබර් 07 දක්වා වන කාලය තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙන්ම නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ. 2019 දෙසැම්බර් 01 වන දින සිට 2020 අප්‍රේල් 01 වන දින දක්වා කාලය තුළ දී රජය විසින් නිවේදනය කරන ලද සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පාර්ලිමේන්තු අනුමැතියට යටත් වේ.

| | | |
|---|---|---|
| 2020 පෙබරවාරි 25 | - | බලපෑමට ලක් වූ, සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. දැනට අක්‍රීය ණය කාණ්ඩයේ සිටින ණයගැතියන් සඳහා, 2020 වසර තුළ දී ලබා දීමට අපේක්ෂිත, නව කාරක ප්‍රාග්ධන ණයවලින් සියයට 75ක් දක්වා ණය ඇප ආවරණයක් සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මෙම පහසුකම හඳුන්වා දෙන ලදී. |
| 2020 මාර්තු 27 | - | කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට පත් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා සියයට 4.00ක පොලී අනුපාතයක් යටතේ, සමුච්චිත වටිනාකම රුපියල් බිලියන 50ක් වූ "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම" (අදියර I - ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය) යන සහනදායී ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. |
| 2020 අප්‍රේල් 01 | - | කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ස්වයං රැකියා සහ තනි පුද්ගල ව්‍යාපාර ඇතුළුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා 1949 අංක 58 දරණ මුදල් පනතේ 88 වන වගන්තිය ප්‍රකාරව "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම" (අදියර I) යන ණය යෝජන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2020 අප්‍රේල් 09 | - | කොවිඩ්-19 ව්‍යාප්තිය සැලකිල්ලට ගෙන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) යටතේ, කෙටි කාලීන බෝග වර්ග 33ක් වගා කිරීමෙහි නියැළී සිටින සුළු පරිමාණ ගොවීන්ට සහය දැක්වීමේ අරමුණින් වාර්ෂික ණය පොලී අනුපාතය සියයට 7.00 සිට සියයට 4.00 දක්වා අඩු කිරීමටත් "සෞභාග්‍යා" ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන ඇතුළත් කිරීම සඳහාත් සරුසාර ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2020 ජූනි 16 | - | වයස අවුරුදු 18-40ත් අතර නව තරුණ ව්‍යවසායකයන් සඳහා ලබා දෙනු ලබන උපරිම ණය මුදල, රුපියල් 50,000ක ප්‍රදානය ද ඇතුළත්ව රුපියල් 500,000 දක්වා වැඩි කිරීම සඳහා "ස්වශක්ති" රැකියා දසලක්ෂයක් කරා ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| | - | කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට පත් වූ ව්‍යාපාරවලට සහාය වීම සඳහා සියයට 4.00ක පොලී අනුපාතයක් යටතේ, 2020 මාර්තු 27 වන දින හඳුන්වා දෙන ලද සහනදායී ණය යෝජනා ක්‍රමය රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී ("සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම" - අදියර II). |
| 2020 ජූනි 18 | - | රජය විසින් සිදු කළ යුතු ගෙවීම් වෙනුවෙන්, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර නිකුත් කිරීම මගින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ඉදිකිරීම් අංශය සඳහා මාසිකව සියයට 4.00 නොඉක්මවන සහනදායී අනුපාතයක් යටතේ ලබා දෙන ණය සඳහා වන පොරොන්දු පත්‍රයක් මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත විශේෂ ද්‍රවශීල පහසුකමක් හඳුන්වා දෙන ලදී. |
| 2020 ජූනි 19 | - | කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා කාරක ප්‍රාග්ධන ණය සැපයීමේ අරමුණින්, මුදල් නීති පනතේ 83 වන වගන්තිය ප්‍රකාරව "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම" (අදියර II) යටතේ මෙහෙයුම් උපදෙස් පරිශිෂ්ඨයක් නිකුත් කරන ලදී. |
| 2020 ජූනි 30 | - | අනෙකුත් අදියර දෙක හා සමගාමීව ක්‍රියාත්මක කිරීම සඳහා, මුදල් නීති පනතේ 108 වැනි වගන්තිය යටතේ, "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකම" (අදියර III) යන නමින්, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි බලපෑමට පත් ව්‍යාපාර සඳහා තවදුරටත් පහසුකම් සැපයීමට ණය ඇප ආවරණ සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. |
| 2020 ජූලි 01 | - | කෘෂිකර්මාන්තය, පශු සම්පත් සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආපදාවට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් සඳහා ණය පහසුකම් සැපයීමේ |

අරමුණින් වාර්ෂික පොලී අනුපාතිකය සියයට 8.00 සිට සියයට 6.00 දක්වා අඩු කිරීම සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2020 ජූලි 24 - "රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය" මත පදනම්ව, ඉදිකිරීම්, ඖෂධ අංශ සහ අනෙකුත් හඳුනාගත් අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් සඳහා සැපයිය හැකි වන පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම පුළුල් කරන ලදී.

## මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

2020 ජනවාරි 30 - සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය ගැනුම්කරුවන්ට ණය ආධාර සැපයීම සඳහා විශේෂ ණය ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2020 මාර්තු 01 - අපනයන ආදායමෙන් අපනයන ණය පහසුකම් පියවීම සඳහා ගත වන උපරිම කාලය නැව්ගත කළ දින සිට දින 180ක් දක්වා දීර්ඝ කරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2020 මාර්තු 19 - ණයවර ලිපි යටතේ තෝරාගත් මෝටර් වාහන ආනයනය කිරීම සහ ණයවර ලිපි, ප්‍රතිග්‍රහණ ලියවිලි හා අත්තිකාරම් ගෙවීම් යටතේ තෝරාගත් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම අත්හිටුවන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. තව ද, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම අත්හිටුවන ලදී.

2019 මාර්තු 24 - කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් දැඩි බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා සහන සැලසීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් ලබාදුන් විධානය සහ කැබිනට් අමාත්‍ය මණ්ඩල තීරණයට සමගාමීව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් මේ සම්බන්ධයෙන් ලබා දිය යුතු සහන ක්‍රියාමාර්ග දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2020 මාර්තු 27 - කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් බලපෑමට ලක් වූ ස්වයං රැකියාවල නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින් ඇතුළුව ව්‍යාපාර සඳහා සහාය දැක්වීමට 2020 මාර්තු 25 සිට ක්‍රියාත්මක වන ප්‍රතිමූල්‍ය පහසුකමට සහභාගී වීමට අවශ්‍ය සුදුසුකම් දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ 2020 මාර්තු 24 දින 2020 අංක 04 දරන චක්‍රලේඛයට අතිරේකව වන අතර, ප්‍රතිමූල්‍ය පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ මෙමගින් සපයනු ලැබේ.

- බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිත බව සහ ස්ථාවරත්වය පිළිබඳව ඇගයීමෙන් පසුව, කොවිඩ්-19 නිසා බලපෑමට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහාය වීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ක්‍රියාත්මක කළ යුතු සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලදී. මේ අනුව, දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු සහ එසේ නොවන බැංකු සඳහා ඔවුන්ගේ ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂ මට්ටම් පහත දැමීමට අවසරදීම, ණය වර්ගීකරණ පිළිබඳ ඇතැම් අවශ්‍යතා ලිහිල් කිරීම, විදේශ මුදලින් පියවීමට ගිවිසගෙන ඇති ණය, කොන්දේසිවලට යටත්ව රුපියල්වලින් පියවා ගැනීමට අවසර දීම සහ 2020 අවසානය වන විට සැපිරීමට නියමිත ඉහළ නංවන

| | | |
|---|---|---|
| | | ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා මේ වන විට සපුරා නොමැති බැංකු හට ඒ සඳහා 2022 වසර අවසානය තෙක් කල් ලබා දීම සිදු විය. |
| 2020 අප්‍රේල් 17 | - | 2020 අප්‍රේල් 16 දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යැමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, වාණිජ බැංකු විසින් දෛනිකව මහ බැංකුවේ පවත්වා ගත යුතු අවම තැන්පතු (සංචිත) අවශ්‍යතාව සියයට 90 සිට සියයට 20 දක්වා අඩු කරන ලදී. |
| 2020 අප්‍රේල් 27 | - | කොවිඩ්-19 වසංගතය හමුවේ සිය කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා පියවා ගැනීමට සිය රන් භාණ්ඩ උකස් තබන අඩු ආදායම්ලාභීන්ට සහනයක් සැපයීම සැලකිල්ලට ගනිමින් පුද්ගලික ස්වර්ණාභරණ ඇප ලෙස තබා ගන්නා උකස් අත්තිකාරම් සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාතය පහත දමමින් මුදල් නීති පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2020 මැයි 05 | - | කොවිඩ්-19 වසංගතය නිසා බැංකුවල ද්‍රවශීලතා මත ඇතිවිය හැකි බලපෑම් මගහැරවීමේ අරමුණින් යුතුව, බලපත්‍රලාභී බැංකු වෙත ද්‍රවශීලතා සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුවිශේෂී නියාමන ක්‍රියාමාර්ග ගන්නා ලදී. මේ අනුව, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාත ගණනය සඳහා කොන්දේසිවලට යටත්ව, ඇතැම් වත්කම් ද්‍රවශීල ලෙස සැලකීමට සහ වැඩිදියුණු කරන ලද නියාමන සහ නිරන්තර වාර්තාකරණයන්ට යටත්ව, ද්‍රවශීල ආවරණ අනුපාත හා ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාත සඳහා අවම අවශ්‍යතා මට්ටම් පහත දැමීමට 2021 ජූනි 30 දක්වා අවසර ලබා දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. තව ද, බලපත්‍රලාභී බැංකු සඳහා වන හදිසි ණය සහ අත්තිකාරම් සැපයීමේ රාමුව යටතේ පිළිගත හැකි සුරැකුම් සහ ද්‍රවශීලතා පුරෝකතන පදනම් කරගනිමින් බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා රුපියල් ණය පහසුකම් ලබා ගැනීමට ද අවස්ථාව සලසන ලදී. |
| 2020 මැයි 13 | - | බලපත්‍රලාභී බැංකුවල මුදල් ප්‍රවාහ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සහ ද්‍රවශීලතා යෝග්‍ය මට්ටමින් පවත්වාගෙන යැම තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලද අතර ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල මුදල් ලාභාංශ ගෙවීම, ලාභ මෙරටින් බැහැර කිරීම, තම කොටස් ආපසු මිලට ගැනීම, කළමනාකරණ දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ඉහළ දැමීම වැනි කටයුතු තාවකාලිකව සීමා කරන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත නියෝග කරන ලදී. තව ද, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව සහ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලෙස සහ අත්‍යාවශ්‍ය නොවන වියදම් සිදු කිරීමෙන් හැකිතාක් දුරට වළකින ලෙසට ද දැනුම් දෙන ලදී. |
| 2020 මැයි 15 | - | මෝටර් රථ මිලදී ගැනීම සඳහා ලබා දෙන ණය පහසුකම් සඳහා වන වටිනාකම මත ණය අනුපාතික පිළිබඳ පෙර පැවති බැංකු පනත් විධාන ආදේශනය කරමින් නව බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2020 ජූනි 19 | - | බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම් නව විදේශ විනිමය ලැබීම් මගින් මිලට ගන්නේ නම් හැර, ඉදිරි මාස තුනක කාලයක් සඳහා තාවකාලිකව නවත්වන ලෙස දැනුම් දෙමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2020 ජූලි 16 | - | රජය විසින් 2020.12.31 දින දක්වා කාලය තුළ දී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවිය යුතු හිඟ බිල්පත් සඳහා නිකුත් කර ඇති ප්‍රතිග්‍රාහක ලිපි මත පදනම්ව, බලපත්‍රලාභී බැංකු මගින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත්කරුවන් වෙත ද්‍රවශීලතා සැපයීමේ යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය පහසුකම්, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාත ගණනය කිරීමේ දී සියයට 10ක ආන්තිකයක් සහිතව 2020.12.31 දින දක්වා ද්‍රවශීල වත්කම් සැලකීමට බලපත්‍රලාභී බැංකු වෙත අවසර ලබා දෙමින් බැංකු පනත් විධානයක් නිකුත් |

කරන ලදී. තව ද, නව ආර්ථික කටයුතු සඳහා ලබා දෙන ලද මෙම නව ණය පහසුකම්, ණය වර්ගීකරණයේ දී, ගනුදෙනුකරුගේ අනෙකුත් ණය පහසුකම්වල වත්මන් වර්ගීකරණය නොසලකමින් සක්‍රීය ණය ලෙස සැලකීමට බලපත්‍රලාභී බැංකු වෙත අවසරය ලබා දෙන ලදී. මෙම හිඟ බිල්පත් සඳහා නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපි සහ සෞභාග්‍යා III වන අදියර - කොවිඩ්-19 පුනරුද ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ලබා දුන් ණය ඇපකර, ඒවා සලකමින් ලබා දුන් ණය පහසුකම් සඳහා පිළිගත හැකි අවදානම් අවම කිරීමේ උපකරණ ලෙස සැලකීමටත්, ඒ අනුව ඒවා සියයට බිංදුවක අවදානම මත බර තැබීමටත් අවසර ලබා දෙන ලදී.

- බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු (ලීසිං) සමාගම් විසින් සංචාරක ක්ෂේත්‍රයේ නිරත රථවාහන සඳහා ලබා දී අති කල්බදු පහසුකම්වල හිඟ ඇති ප්‍රාග්ධන ප්‍රමාණ සඳහා දැනට ලබා දී ඇති ණය සහන කාල සීමාව දීර්ඝ කරන ලෙස දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙහි දී මූල්‍ය ආයතන විසින් ණය සහන කාලසීමාවට අදාළ පොලී ගනුදෙනුකරුවන් අපහසුතාවයට ලක් නොවන ආකාරයෙන් අයකර ගැනීමට කටයුතු කළ හැකි අතර, එකී ගනුදෙනුකරුවන්ගේ එකතු වී ඇති නොගෙවූ දඩ පොලී කපා හැරීමට කටයුතු කළ යුතුය. තව ද, මෙම ණය සහන කාලය තුළ සමාන වටිනාකමින් යුතු වාරික ණය (EMI loans) හා පොදු ප්‍රවාහන පහසුකම් සපයන බස් රථ සඳහා ලබා දී ඇති කල්බදු පහසුකම් සම්බන්ධයෙන් අය කළ හැකි උපරිම අමතර පොලී අනුපාතය සහ එම අමතර පොලී අය කළ යුතු ආකාරය පිළිබඳ බලපත්‍රලාභී බැංකු දැනුම්වත් කරන ලදී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සැලකිය හැකි උපරිම පිරිවැටුම් සීමාව රුපියල් බිලියන 1 දක්වා ඉහළ දමමින් බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ බැංකු පනත් විධාන සංශෝධනය කරන ලදී.

2020 අගෝස්තු 21 - බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් ණය සඳහා අය කළ හැකි උපරිම පොලී අනුපාත සීමා කරමින් පැවැති මුදල් නීති පනත් විධාන වෙනුවට නව මුදල් නීති පනත් විධානයක් නිකුත් කරන ලදී. මේ අනුව, ණය කාඩ්පත්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික අයිරා, උකස් අත්තිකාරම් සඳහා අය කළ හැකි පොලී අනුපාත, සියලු ණය පහසුකම් සඳහා අය කළ හැකි දඩ පොලී අනුපාත සහ අපනයනකරුවන් සඳහා ලබා දෙන අත්තිකාරම් සඳහා අය කළ හැකි අමතර පොලී අනුපාත සඳහා උපරිම සීමාවන්, දැනට පවත්නා වෙළඳපොළ පොලී අනුපාත හා සමගාමීව පහත දමන ලදී.

2020 අගෝස්තු 26 - කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත ලබා දී ඇති ණය සහන කාලය දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2020 සැප්තැම්බර් 08 - බලපත්‍රලාභී බැංකුවල ඡන්ද අයිතිය හිමි නිකුත් කළ ප්‍රාග්ධනයේ ප්‍රාමාණික හිමිකමක් අත්පත් කර ගැනීම සඳහා තිබූ සීමා ඉහළ දමමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. මේ අනුව, බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධානවලට, වසර 10ක් ඇතුළත අදාළ කොටස් හිමිකාරීත්වය සියයට 15 දක්වා පහත ඇමීමේ කොන්දේසියට යටත්ව, බලපත්‍රලාභී බැංකුවල සියයට 20ක් නොඉක්මවූ ප්‍රාමාණික හිමිකමක් අත්පත් කර ගැනීමට අවසර ලබා දෙන ලදී.

2020 සැප්තැම්බර් 30 - ආමුඛ ආයෝජන හුවමාරු ගිවිසුම් (Inward Investment Swaps) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සඳහා අදාළ පොදු කොන්දේසි හා නියමයන් සංශෝධනය කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

## බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන්

2020 පෙබරවාරි 14 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09: මූල්‍ය උපකරණ සහ මහ බැංකුවේ විචක්ෂණශීලී අවශ්‍යතාවයට අනුගත වෙමින් ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම් පිළිබඳ අවම අවශ්‍යතා සහිතව නියෝගයක් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී.

2020 පෙබරවාරි 17 - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09: මූල්‍ය උපකරණ සහ මහ බැංකුවේ විචක්ෂණශීලී අවශ්‍යතාවයට අනුගත වෙමින් ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම් පිළිබඳ අවම අවශ්‍යතා සහිතව නියෝගයක් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2020 මාර්තු 10 - බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් මගින් සුදුසුකම් ලත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණයගැතියන් සඳහා ණය ආධාර සැපයීමට විශේෂ ණය ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශ සපයමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2020 මාර්තු 24 - කොවිඩ්-19 ව්‍යසනයෙන් බලපෑමට පත් ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහන සැලසීම සඳහා චක්‍රලේඛයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2020 මාර්තු 27 - 2020 මාර්තු 24 දින නිකුත් කරන ලද චක්‍රලේඛයට අතිරේකව සහ කොවිඩ්-19 ව්‍යසනයෙන් බලපෑමට පත් ස්වයං සේවා නියුක්තිකයින් ඇතුළු ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ආධාර කිරීමට රුපියල් බිලියන 50ක සය මාසික ප්‍රතිමූල්‍ය පහසුකමක් ස්ථාපිත කිරීම සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සහිත චක්‍රලේඛයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2020 මාර්තු 31 - වර්තමානයේ වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වාගෙන යනු ලබන ද්‍රවශීල වත්කම් සඳහා පවතින විධානය සංශෝධනය කර නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි නව විධානයක් නිකුත් කරන ලදී.

2020 අප්‍රේල් 24 - දේශීයව එකලස් කරනු ලබන මෝටර් කාර් රථ, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) සහ වෑන් රථ සඳහා වටිනාකම් මත ණය අනුපාතය ඉහළ නැංවීම ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කර ඇති වටිනාකම මත ණය අනුපාත විධානය සංශෝධනය කරන ලදී.

- බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කර ඇති තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයෙහි පොලී අනුපාත සුළු වශයෙන් අඩු කර සංශෝධනය කරන ලදී.

2020 ජූනි 18 - මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව දැනටමත් අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරනු ලබන සහ වයස අවුරුදු 70 සම්පූර්ණ වූ අධ්‍යක්ෂවරයෙකුට තම ධූරයේ අඛණ්ඩව කටයුතු කරගෙන යෑම සඳහා අවසරය ලබා දෙමින් ආයතනික යහපාලන විධානය සංශෝධනය කර බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී.

2020 ජූනි 26 - මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව දැනටමත් අධ්‍යක්ෂ ධූරයේ කටයුතු කරනු ලබන සහ වයස අවුරුදු 70 සම්පූර්ණ වූ අධ්‍යක්ෂවරයෙකුට තම ධූරයේ අඛණ්ඩව කටයුතු කරගෙන යෑම සඳහා අවසරය ලබා දෙමින් ආයතනික යහපාලන විධානය සංශෝධනය කර විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත විධානයක් නිකුත් කරන ලදී.

2020 ජූලි 16 - "ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම්" යන නමින් නව විධානයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිකුත් කරන ලදී. අනුමත කිරීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීම, නව ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීමට සැලසුම් කිරීමේ දී අවශ්‍ය අවම නිර්ණායක සකස් කිරීම,

| | | |
|---|---|---|
| | | අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත වගකීම් පැවරීම, අවම වශයෙන් පවත්වා ගත යුතු අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් සකස් කිරීම සහ පවත්නා අනෙකුත් සේවා ස්ථාන ප්‍රමිතිකරණය කිරීම යන මූලික කරුණු එහි අඩංගු වේ. |
| | - | 2020 මාර්තු 27 දින නිකුත් කරන ලද 2020 අංක 05 දරන චක්‍රලේඛයට අනුව සංචාරක කර්මාන්තයට අදාළ රථ වාහන සඳහා ලබාගෙන ඇති කල්බදු පහසුකම්වල මුල් මුදල ගෙවීම සඳහා ලබා දී තිබූ මාස 06ක සහන කාල සීමාව තවත් මාස 06කින් දීර්ඝ කරන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2020 ජූලි 30 | - | මාස 12කට වැඩි කාලයකින් කල් පිරෙන ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බැඳුම්කර (ලියමනකින් හෝ බැඳීමකින් නිදහස්) සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ලියමනකින් හෝ බැඳීමකින් නිදහස්) ද්‍රවශීල වත්කම් ලෙස ඇතුළත් කරමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය යටතේ ද්‍රවශීල වත්කම් අර්ථ දැක්වීම සංශෝධනය කරන ලදී. |
| 2020 අගෝස්තු 20 | - | "ව්‍යාපාර පුළුල් කිරීම සහ මෙහෙයුම්" යන නමින් නව විධානයක් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා නිකුත් කරන ලදී. අනුමත කිරීමේ ක්‍රියාවලිය සංශෝධනය කිරීම, නව ව්‍යාපාරික ස්ථාන විවෘත කිරීමට සැලසුම් කිරීමේ දී අවශ්‍ය අවම නිර්ණායක සකස් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත වගකීම් පැවරීම, අවම වශයෙන් පවත්වා ගත යුතු අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් සකස් කිරීම සහ පවත්නා අනෙකුත් සේවා ස්ථාන ප්‍රමිතිකරණය කිරීම යන මූලික කරුණු එහි අඩංගු වේ. |
| 2020 සැප්තැම්බර් 28 | - | බලපත්‍රලාභී මුදල් සමාගම්වල නිල වෙබ් අඩවියේ සහ පුවත්පත්වල භාෂා ත්‍රිත්වයෙන් ම මූල්‍ය තොරතුරු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක පළ කිරීම සඳහා හඳුන්වා දුන් නව ආකෘතිය අනුගමනය කරන ලෙසට සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී. තව ද, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තම නිල වෙබ් අඩවියේ ස්වාධීන විගණන වාර්තාව සමඟ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ණය ශ්‍රේණිගත කිරීමේ වාර්තා භාෂා ත්‍රිත්වයෙන් ම පළ කළ යුතුය. |
| 2020 සැප්තැම්බර් 30 | - | කොවිඩ්-19 මගින් බලපෑමට ලක් වූ සංචාරක ක්ෂේත්‍රයේ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන ලබා දීම සඳහා ලබා දී තිබූ ණය සහන කාලසීමාව 2020 ඔක්තෝබර් 01 දින සිට 2021 මාර්තු 31 වන දින දක්වා තවත් මාස 06කින් දීර්ඝ කරමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | - | කොවිඩ්-19 වසංගතයේ දීර්ඝ කාලීන බලපෑම හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක මෙහෙයුම් පරිසරය සලකා 2020 මාර්තු 31වන දින නිකුත් කරන ලද බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වා ගත යුතු ද්‍රවශීල වත්කම් පිළිබඳ විධානය සංශෝධනය බලපැවැත්වෙන කාලය තවත් මාස හයකින් 2021 මාර්තු 31 දක්වා දීර්ඝ කරන ලදී. |
| අපේක්ෂිත | - | 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතට සංශෝධන හඳුන්වා දීම මගින් මුදල් සමාගම්වල නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම |
| | - | වර්තමාන වෙළඳපොළ සංවර්ධනයට ගැලපෙන පරිදි නව විධාන නිකුත් කිරීම හා දැනට පවත්නා විධාන නැවත සලකා බලමින්, බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් ඇතුළුව පවත්නා නියාමන රාමුව පරිපූර්ණ දැක්මක් සහිතව සමාලෝචනය කිරීම හා විධිමත් කිරීම. බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා හිමිකාරිත්ව සීමාවන් පිළිබඳ විධාන ඉදිරියේ දී නිකුත් කිරීමට කටයුතු කිරීම, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ආයතනික යහපාලනය පිළිබඳ විධාන නිකුත් කිරීම, ප්‍රාථමික |

අලෙවිකරුවන් සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විධාන නිකුත් කිරීම සහ අවම ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ විධාන සංශෝධනය කිරීම යනාදිය අපේක්ෂා කෙරේ

- හොඳින් ක්‍රියාත්මක වන සහ ප්‍රශස්ත මුදල් සමාගම් ස්ථාපිත කිරීමේ අරමුණින් මධ්‍ය කාලීන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම

- නීති කෙටුම්පත්කරුගේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත සකස් කර අවසන් කිරීම සහ පනතට අනුකූලව නියාමන රාමුවක් සකස් කිරීම

- ඉහළ අවධානමක් සහිත සහ අර්බුදයන්ට ලක්ව ඇති මුදල් සමාගම් සඳහා ප්‍රමිතිගත නිරාකරණ සැලැස්මක් ද ඇතුළුව, මුදල් සමාගම්වල බලපත්‍ර අවලංගු කිරීම සහ ඈවර කිරීම සඳහා කඩිනම් ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම සඳහා විධානයක් නිකුත් කිරීම

## රක්ෂණය

2020 පෙබරවාරි 19 - ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වැඩසටහනේ තාක්ෂණික සහාය යටතේ පාරිභෝගික අධ්‍යාපන උපායමාර්ගය ක්‍රියාත්මක කරන ලදී.

2020 පෙබරවාරි 25 - 2017 ජූලි 05 දිනැති අතිවිශේෂ ගැසට් අංක 2026/27හි ප්‍රකාශයට පත් කරන ලද 'අලාභ ගැලපුම් සේවා ලියාපදිංචි කිරීමේ රීති' පිළිබඳ 42වන වක්‍රලේඛය නිකුත් කිරීම මගින් බලපත්‍ර රහිත අලාභ ගැලපුම් සේවා ලබා ගැනීමෙන් වැළකී සිටින ලෙසට සියලුම රක්ෂණ සමාගම් වෙත නියම කරන ලදී.

2020 අප්‍රේල් 11 - කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ, රක්ෂණ ඔප්පු හිමියන්ට සහනයක් වශයෙන් අවශ්‍ය සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට සහායක් වශයෙන්, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කොටස්හිමියන්ට පළමු හා අවසාන ලාභාංශ ගෙවීම අත්හිටුවීම අධීක්ෂණය කරන ලදී.

- කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත වෙනත් සහන ක්‍රියාමාර්ග:

  - 2020 මාර්තු 01 සිට 2020 ජූනි 30 දක්වා ප්‍රතිරක්ෂණ ලබා දී ඇති රක්ෂණ ඔප්පු සඳහා සමාගම් නිලධාරියෙකුගේ නිශ්චිත තහවුරු කිරීමකට යටත්ව, නුඹුන්වත් කටයුතු සඳහා දින 90ක් දක්වා හිඟ වාරික සලකා බැලීමට දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ සමාගම්වලට අවසර දෙන ලදී.

  - රක්ෂකයා/රක්ෂණ සමාගමේ අදාළ නිලධාරියා විසින් සපයනු ලබන "අවදානම් පදනම් කර ගත් ප්‍රාග්ධන අවශ්‍යතා (උදා:- ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය, පවතින සමස්ත ප්‍රාග්ධනය සහ අවශ්‍ය අවදානම් ප්‍රාග්ධනය) සහ නියෝග අංක 01 දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා දක්වන අනුකූලතාවය" 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ මාසයේ සිට සමීපව අධීක්ෂණය කරන ලදී.

  - දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ සමාගම් විසින් 2015 රීතිවලට අනුව අවදානම් ගණනය කිරීම සඳහා අවදානම් රහිත පොලී අනුපාතය (RFR) භාවිතා කර තිබේද යන්න අධීක්ෂණය කරන ලදී.

  - තව ද, එක් එක් ගනුදෙනුකරුවන් පදනම් කරගෙන කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් (නියෝග අංක 01) හා වාරික ගෙවීම මත ලබා දී ඇති ණය දීර්ඝ කිරීම හේතුවෙන් ඇති වන සෘණාත්මක බලපෑම ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් සලකා බලන ලදී.

2020 ජූනි 03 - තැරැව්කාර සමාගම් ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා දීර්ඝ කාලයක් ගන්නා විට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලබන බලාත්මක කිරීමේ

| | | |
|---|---|---|
| | | ක්‍රියාමාර්ග සඳහා "අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුකූල වීම" යන 19වන විධානය සංශෝධනය කරන ලදී. |
| 2020 ජූනි 08 | - | ශ්‍රී ලංකා රක්ෂණ සංගමය සහ රක්ෂණ ආයතන කිහිපයක අදහස් ඇතිව රක්ෂණ සමාගම් සඳහා ආයතනික පාලන රාමුව පිළිබඳව 17වන විධානය සංශෝධනය කරන ලදී. |
| 2020 ජූලි 02 | - | රක්ෂණ ඔප්පුහිමියන් විසින් ප්‍රතිපත්ති නියමයන් සහ කොන්දේසි අවබෝධ කර ගැනීම සහතික කිරීම සඳහා සියලුම රක්ෂණ සමාගම් විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනකින් රක්ෂණ ඔප්පු නිකුත් කරන ලෙස චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (Financial Sector Modernisation Project):- ඉහත ව්‍යාපෘතියට අදාළ පැවරුම් හා ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කිරීම |
| | - | ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව, අදාළ පැවරුම් ලැබුණු විට නෛතික හා නියාමන ප්‍රතිසංස්කරණ සිදු කිරීම |
| | - | මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයට (NFIS) අදාළ නියම කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම |
| | - | නියෝජිතයන් සම්බන්ධව පරීක්ෂණ පවත්වන සියලුම රක්ෂණ සමාගම්/තැරැව්කරුවන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පිළිබඳ උපදෙස් නිකුත් කිරීම |

## කොටස් වෙළඳපොළ

| | | |
|---|---|---|
| 2020 මාර්තු 31 | - | කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ වෙළඳපොළ පසුබෑමෙන් පීඩාවට පත් ආයෝජකයින්ට සහන සැලසීමේ අරමුණින්, සියලුම ලියාපදිංචි ආන්තික සැපයුම්කරුවන්ට/බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන්ට මහ බැංකුව විසින් 2020 ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද තීරණවලින් ඔවුන් ලබා ගත් ප්‍රතිලාභ ලබාදෙන ලෙසට නියම කරන ලද අතර, 2020 ජූනි 30වන දින දක්වා තම සේවාදායකයන්ට ලබා දී ඇති ණය සඳහා පොලී අයකර ගැනීමෙන් වළකින ලෙසට නියෝග කරන ලදී. තව ද, සියලුම ආන්තික සැපයුම්කරුවන්/බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවන් සිය කාර්යයන් ඉටු කිරීමේ දී සියලුම සේවාදායකයන්හට යහපත් ආකාරයෙන් සහ සමානාත්මතාවයෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ. |
| 2020 අප්‍රේල් 30 | - | කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතන විසින් වාර්තා ඉදිරිපත් කළ යුතු කාල සීමාව පහත පරිදි දීර්ඝ කරන ලදී. |

- 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල විගණනය නොකළ මූල්‍ය වාර්තා, අනුකූලතා නිලධාරීන්ගේ වාර්තා සහ ඒකක භාර ප්‍රතිලාභ ඉදිරිපත් කිරීමේ අවසාන දිනය නියමිත කාල සීමාවේ සිට සති තුනක කාලයක් දක්වා දීර්ඝ කරන ලදී.
- 2019 දෙසැම්බර් 31 සහ 2020 මාර්තු 31න් අවසන් වන මූල්‍ය වර්ෂ සඳහා විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ අවසාන දිනය නියමිත කාල සීමාවේ සිට මාස 2ක කාලපරිච්ඡේදයක් දක්වා දීර්ඝ කරන ලදී.
- ඒකක භාර අරමුදල් සඳහා වාර්ෂික සහ අතුරු වාර්තා ඉදිරිපත් කිරීම නියමිත කාල සීමාවේ සිට මාස 2ක කාල සීමාවකින් දීර්ඝ කරන ලදී.
- වසංගත කාලපරිච්ඡේදය තුළ දී බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතනවල ආරක්ෂාව සහ යහපත් ක්‍රියාකාරිත්ව සහතික කිරීම සඳහා ඔවුන්ගේ අවදානම් පැතිකඩ සහ සම්පත් පිළිබඳව ක්‍රියාකාරී අධීක්ෂණය සඳහා බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතනවලට උපදෙස් ලබා දෙන ලදී.
- ඉහත දීර්ඝ කිරීම් තිබියදීත්, බලපත්‍රලාභී හෝ ලියාපදිංචි ව්‍යාපාරයට අදාළ වගකීම් ඉටු කිරීමට ඇති හැකියාව කෙරෙහි අහිතකර ලෙස බලපාන හෝ අහිතකර බලපෑමක්

ඇති කිරීමට හැකියාවක් ඇති හෝ එම ආයතනයේ මූල්‍ය තත්ත්වය හෝ මූල්‍ය විශ්වසනීයත්වයට බලපාන ඕනෑම කරුණක් හෝ එහි ප්‍රධාන විධායක නිලධාරියාගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සැක සහිත හෝ සාධාරණ ලෙස අපහසුතාවට පත් විය හැකි අවස්ථා වෙතොත් ඒ පිළිබඳව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවට වහාම වාර්තා කරන ලෙස ආයතනවලට නියම කරන ලදී.

| | | |
|---|---|---|
| | - | සියලුම බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතනවල මූලික නියාමන ක්‍රියාකාරකම්වලට 2020 වසර සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වාර්ෂික බලපත්‍ර/ලියාපදිංචි ගාස්තු අත්හිටුවීම, ඉල්ලීමක් මත පදනම්ව වසරක කාලයක් සඳහා ලබා දෙන ලදී. |
| | - | සියලුම ආයෝජන උපදේශකයන් පෙර සුදුසුකම් රාමුවේ සිට නව සුදුසුකම් රාමුවක් වෙත මාරු කිරීම සඳහා අනිවාර්ය අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවශ්‍යතාවය සපුරාලීමේ කොන්දේසිය මාස හයකින් දීර්ඝ කරන ලදී (2021 ජූනි 30 දක්වා). |
| | - | සියලුම ආයෝජන උපදේශකයින් කොටස් තැරැව්කරුවන්ගේ/බෙදාහැරීමේ සමාගමේ බලපත්‍රය අලුත් කිරීම සඳහා අවම වශයෙන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩමුළු දෙකක් සම්පූර්ණ කළ යුතු අතර, එම යාවත්කාලීන කිරීමේ දිනය 2020 මාර්තු සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ නම්, ඉහත සඳහන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවශ්‍යතාවය සපුරාලීම අලුත් කිරීම සඳහා නියමිත දින සිට මාස හයක කාලයක් දක්වා දීර්ඝ කරන ලදී. |
| 2020 මැයි 28 | - | කොටස් වෙළඳපොළ මූලික ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය කිරීමට පහසුකම් සැලසීමට කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ රෙගුලාසි සංශෝධන කරන ලදී. |
| 2020 ජූනි 11 | - | බලගැන්වීම් පුවරුවෙහි ලැයිස්තුගත කිරීමේ රෙගුලාසි සංශෝධනය ක්‍රියාත්මක කරන ලදී. ඉක්මන් අවධානය යොමු කළ යුතු රෙගුලාසි ඛණ්ඩය සම්පූර්ණ කරන ලදී. රෙගුලාසි අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස කොවිඩ්-19 වසංගතය මගින් ලැයිස්තුගත ආයතන කෙරෙහි ඇති කරන නියාමන බර අවම කිරීමට හදිසි රෙගුලාසි වෙනස් කිරීම් අවශ්‍යදැයි සමාලෝචනය කරනු ලබයි. |
| | - | දේශීය ආයතන විසින් බහු මුදල් ණය ලැයිස්තුගත කිරීම පිළිබඳ නියාමන පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. |
| 2020 ජූලි 15 | - | දේපළ වෙළඳාම් ආයෝජන භාර (SL - REITs - Real Estate Investment Trust) හඳුන්වා දීම. |
| අපේක්ෂිත | - | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් විසින් බලගැන්වීමේ පුවරුව මත නිකුත් කරන ලද ණය සුරැකුම්පත් ලැයිස්තුගත කිරීමේ ප්‍රතිපත්තියක් යෝජනා කිරීම |
| | - | අධ්‍යක්ෂවරුන්/ප්‍රධාන විධායක නිලධාරීන්ගේ ගනුදෙනුවලට අදාළ, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රෙගුලාසි වැඩිදියුණු කිරීම |
| | - | පවරා ගැනීම සහ ඒකාබද්ධ කිරීම, ආයතන ලැයිස්තුගත කිරීම සහ ලැයිස්තුගත ආයතන ඉවත් කිරීම වැනි නියාමන අවශ්‍යතාවලට අදාළව ලැයිස්තුගත ආයතනවල කොටස් තක්සේරු කිරීම සඳහා වන මාර්ගෝපදේශ වැඩිදියුණු කිරීම |
| | - | ආයතනික පාලනය සම්බන්ධයෙන් ලැයිස්තුගත කිරීමේ රෙගුලාසි යෝජනා කිරීම |
| | - | ලැයිස්තුගත සමාගම්වලට විගණනකයන් තෝරා ගැනීම සඳහා පවතින ක්‍රමවේදයට ලැයිස්තුගත රීති ඇතුළත් කිරීම |
| | - | දැනට ක්‍රියාත්මක වන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි උපදේශවලට අනුව පැවරීමට එදිරිව ගෙවීම් යාන්ත්‍රණය (Delivery vs Payment - DVP) සඳහා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම |

## ගෙවීම් හා පියවීම්

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 20 | - | 2014 අංක 1 දරන පොදු විධිවිධානය ප්‍රතිස්ථාපනය කරමින් ජාතික කාඩ්පත් ක්‍රමවේදය යටතේ නිකුත් කරන ගෙවීම් කාඩ්පත් භාවිතා කරමින් සිදු කරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු සඳහා අය කළ හැකි උපරිම ගාස්තු ඇතුළත් කිරීමට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කෙරෙන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු ඇතුළත් 2020 අංක 1 දරන පොදු විධිවිධානය නිකුත් කරන ලදී. |
| 2020 මැයි 14 | - | සුළු පරිමාණ ගෙවීම් සඳහා LANKAQR ප්‍රචලිත කිරීමට, ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්, නිකුත් කරන්නන් හා අත්පත්කරුවන් ලෙස LANKAQR හා සම්බන්ධ වීම අනිවාර්ය කරමින් 2020 අංක 13 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2020 ජූනි 01 | - | ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්හි නව ප්‍රවණතා ආවරණය කරමින් මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීමට 2018 අංක 01 දරන මාර්ගෝපදේශය ප්‍රතිස්ථාපනය කරමින් ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම යෙදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ 2020 අංක 1 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| 2020 ජූනි 08 | - | ලංකාපේ, මංගත ගෙවීම් වේදිකාව හරහා සිදු කෙරෙන විද්‍යුත් මුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවක උපරිම වටිනාකම තීරණය කිරීමේ ක්‍රියාපටිපාටිය ඇතුළත් කිරීමට විද්‍යුත් මුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව සඳහා වූ 2020 අංක 16 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2020 සැප්තැම්බර් 17 | - | ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු ගාස්තු සංශෝධනය කිරීමට සහ ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු භාරගන්නා කාලය දීර්ඝ කිරීමට 2020 අංක 18 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම[2]

| | | |
|---|---|---|
| 2020 පෙබරවාරි 05 | - | අවස්ථා පාදක කරගත් LankaFin වාර්තාකරණය පිළිබඳ 2019 අංක 1 දරන මාර්ගෝපදේශය බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2020 ජූනි 10 | - | මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ අනුකූලතා බැඳීම් පිළිබඳ 2020 අංක 2 දරන මාර්ගෝපදේශය, ගණකාධිකාරීවරුන් සහ භාර හෝ සමාගම් සේවා සපයන්නන් වෙත නිකුත් කරන ලදී. |
| 2020 ජූනි 15 | - | මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධව මතු වන අවදානම් පිළිබඳව සුපරීක්ෂාකාරී වන ලෙස උපදෙස් සපයන 2020 අංක 03 දරන චක්‍රලේඛය, මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2020 ඔක්තෝබර් 22 | - | 2020 අංක 3 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සපයන විද්‍යුත් අතුරු මුහුණත භාවිතයෙන් ප්‍රතිමුඛ (Non-Face-to-Face) ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ තහවුරු කිරීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |

## විදේශ විනිමය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2020 මාර්තු 19 | - | සංචාරක, ව්‍යාපාරික, පුහුණු, විදෙස් වෛද්‍ය ප්‍රතිකාර ආදී ඕනෑම අරමුණක් සඳහා විදේශ ගතවන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් |

2. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් රට තුළ සිදුවූ ආර්ථික හා සමාජීය කටයුතු තාවකාලිකව නවතා දැමීම සැලකිල්ලට ගනිමින්, වාර්තාකරණ ආයතනවලට අදාළ සීමාවට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා කිරීම සඳහා අදාළ කාලසීමාව දීර්ඝ කරමින් 2020 මාර්තු 31 සහ අප්‍රේල් 28 යන දින වල මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ මෙම ලැයිස්තුවේ අන්තර්ගත නොවේ.

එ.ජ. ඩොලර් 5,000ක (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන ප්‍රමාණයක) උපරිමයකට යටත්ව (පෙර අවසර ලබා දී තිබූ එ.ජ. ඩොලර් 10,000ක විදේශ විනිමය සංචාරක දීමනාව හා සැසඳීමේ දී) නිකුත් කිරීමට බලයලත් වෙළඳුන් හට දන්වමින් 2020 විධාන අංක 01 නිකුත් කරන ලදී.

2020 මාර්තු 20 - බැංකු පනතේ ආනයන හා විදේශ ව්‍යවහාර මුදල් ආයෝජන සීමා කිරීමට නිකුත් කරන ලද විධානයන්ට සමගාමීව අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ, ගෙවීම මත ලේඛන (Document against Payments) සහ විවෘත ගිණුම් (Open Account Payments) ක්‍රම යටතේ ආනයනය කිරීම සඳහා වන ගෙවීම්වලට විදේශ විනිමය නිකුත් කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි මාස තුනක කාලයක් සඳහා අත් හිටුවිය යුතු බව බලයලත් වෙළෙඳුන් හට දන්වමින් 2020 විධාන අංක 02 නිකුත් කරන ලදී.

- විනිමය අනුපාතයෙහි ඉහළ උච්චාවචනයන් කළමනාකරණය කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ඩොලර් ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරාලීමට විකුණුම්-ගැනුම් විදේශ විනිමය හුවමාරු වෙන්දේසි ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

2020 අප්‍රේල් 02 - විනිමය අනුපාතිකය මත ඇති විය හැකි පීඩනය සහ ආර්ථිකයට ඇති විය හැකි අහිතකර බලපෑම අවම කිරීම සඳහා මාස තුනක කාලයකට ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ මත යම් සීමාවන් පැනවීම සඳහා අංක 2169/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- පහත සඳහන් අවස්ථාවන් හැර ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් විදේශ ආයෝජන සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා ලබා දී ඇති පොදු අවසරය අත්හිටුවීම.

  (අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන හෝ,

  (ආ) ආයෝජිත රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන ආයෝජන

- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රේෂණ හැර අනෙකුත් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීම.

- දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් යැවීම අත්හිටුවීම.

- සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව එ.ජ. ඩොලර් 30,000ක උපරිමය දක්වා සීමා කිරීම.

- පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා එක් එක් ආයෝජනය මත පදනම්ව ඉහත (අ) සහ (ආ) නිර්ණායක සපුරාලන අවස්ථාවල දී අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

2020 අප්‍රේල් 03 - අවශ්‍ය වූ විටෙක දී අවසාන පිළියම වශයෙන්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය, ගිණුම්හිමියා විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහයන් නොලබන විට දී, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර අයකර ගැනීම සිදු කළ යුතු බව දන්වමින් 2020 විධාන අංක 03 නිකුත් කරන ලදී.

2020 අප්‍රේල් 08 - ද්විත්ව පුරවැසියන් ඇතුළුව ශ්‍රී ලංකාව තුළ හෝ පිටත නේවාසික ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු, ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුරවැසියන්, ශ්‍රී ලාංකික සම්භවයක් ඇති

වෙනත් රටවල පුරවැසියන් සහ අරමුදල්, සංස්ථාපිත ආයතන, සංගම් හා ශ්‍රී ලංකාවේ සුභසිද්ධිය පතන වෙනත් පාර්ශ්ව ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වෙනත් ඕනෑම පුද්ගලයන් සඳහා විශේෂ තැන්පතු ගිණුමක් හඳුන්වා දීම සඳහා අංක 2170/4 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2020 අප්‍රේල් 09 - විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීම, පවත්වාගෙන යාම අවසරලත් හර බැර පිළිබඳ නිර්ණායක සඳහන් කරමින් 2020 අංක 04 දරන විධානය නිකුත් කරන ලදී.

2020 අප්‍රේල් 16 - අවශ්‍ය වූ විට දී අවසාන පිළියම වශයෙන්, විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ලබා දුන් ණය, ණයගැතියා විදේශ විනිමය මුදල් ප්‍රවාහයක් නොලබන විටක දී, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර අය කර ගැනීම සිදු කළ යුතු බව දන්වමින් 2020 විධාන අංක 05 නිකුත් කරන ලදී.

2020 ජූලි 01 - ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික යම් තැනැත්තෙකු හට සන්තකයේ තබා ගත හැකි විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය එ.ජ. ඩොලර් 10,000 සිට එ.ජ.ඩොලර් 15,000 දක්වා ඉහළ නැංවීම සඳහා අංක 2182/33 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- විශේෂ තැන්පතු ගිණුම් හිමියන් හට ගිණුමේ ශේෂය මත, බලපත්‍රලාභී වෙළෙන්දන්ගෙන් ණය ලබා ගැනීමට අවසර ලබා දෙන අතරතුර, විශේෂ තැන්පතු ගිණුම් වෙත අරමුදල් ප්‍රභවය පුළුල් කිරීම සඳහා අංක 2182/32 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2020 ජූලි 02 - අංක 2169/3 දරන අති විශේෂ ගැසට් නිවේදනය කල් ඉකුත් වීම හේතුවෙන් මාස 6ක කාලයක් සඳහා ප්‍රතිමුඛ ප්‍රේෂණ වෙනුවෙන් නව පියවර පැනවීම සඳහා අංක 2182/37 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජනය කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කරන පහත දැක්වෙන ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටවනු ලැබේ.

  (අ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන,

  (ආ) ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්,

  (ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා, දැනටමත් විදේශයක සංස්ථාපිත හෝ පිහිටුවා ඇති හා පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයන්/අරමුදල් යෙදවීමක්,

  (ඈ) දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා එ.ජ. ඩොලර් 20,000ක උපරිමය දක්වා සිදු කරන ප්‍රේෂණ.

- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ජංගම ගනුදෙනු හෝ එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හැර අනෙකුත් ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටවනු ලැබේ.

- සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව එ.ජ. ඩොලර් 30,000ක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.
- දැනටමත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පා ඇති විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් නැවත යැවීම එ.ජ. ඩොලර් 20,000ක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.
- පොදු අවසරයෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා ඉහත (අ) සහ (ආ) නිර්ණායක සපුරාලන අවස්ථාවල දී එකින් එක සලකා බැලීමේ පදනම මත අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

2020 ජූලි 06 - විශේෂ තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම, අවසරලත් හර බැර සහ වෙනත් අවශ්‍යතාවයන් වෙනුවෙන් වැඩිදුර නිර්ණායක සඳහන් කරමින් 2020 අංක 6 දරන විධාන නිකුත් කරන ලදී.

2020 සැප්තැම්බර් 23 - අනේවාසියන්ගේ අභ්‍යන්තර ආයෝජන ගිණුම් හරහා ගලා එන විදේශ මුදල් හා සම්බන්ධ විදේශ විනිමය අවධානම අඩු කිරීම සඳහා "අභ්‍යන්තර ආයෝජන හුවමාරු ගිවිසුම්" නම් වූ යෝජනා ක්‍රමය යටතේ වසරකට වැඩි කාලයක සිට අවුරුදු දෙකක් දක්වා වූ කාලයක් සඳහා වන එ.ජ.ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල් මිලදී ගැනුම් - විකිණුම් මුදල් හුවමාරු ගිවිසුම්වලට අදාල මෙහෙයුම් උපදෙස් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිකුත් කරන ලදී. මෙය රට තුළට නැවුම් විදේශ විනිමය ගලාඒම් දිරිමත් කිරීම උදෙසා සිදුකරන ලදී.

2020 ඔක්තෝබර් 06 - විශේෂ තැන්පතු ගිණුම්වල නම් කරන ලද කල්පිරීමේ දිනය ඉක්මවීමෙන් පසුව ද බලයලත් වෙළෙඳුන් විසින් ලබාදෙන සාමාන්‍ය කාලීන තැන්පතු පොලිය සමඟ අලුත් කිරීමට හා පවත්වාගෙන යාමට සහ කාලීන තැන්පතුවල කල්පිරීම මත පරිවර්තනයට හා ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට, අංක 2196/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් අවසර ලබා දෙන ලදී.

2020 ඔක්තෝබර් 07 - විශේෂ තැන්පතු ගිණුම්වලට ලද පොලිය ඇතුළු කල්පිරීමේ දී ලද මුදල්, විශේෂ තැන්පතු ගිණුම් හිමියා පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම් (PCFAs) විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විට දී, එම ගිණුමට බැර කිරීමට අවසර ලබා දෙමින් 2020 අංක 07 දරන විධානය බලපත්‍රලාභී වෙළෙඳුන් වෙත නිකුත් කරන ලදී.

- විශේෂ තැන්පතු ගිණුම්වලට ලද පොලිය ඇතුළු කල්පිරීමේ දී ලද මුදල්, විශේෂ තැන්පතු ගිණුම් හිමියා ආමුඛ ආයෝජන ගිණුම් (IIAs) විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විට දී, එම ගිණුමට බැර කිරීමට අවසර ලබා දෙමින් 2020 අංක 08 දරන විධානය බලපත්‍රලාභී වෙළෙඳුන් වෙත නිකුත් කරන ලදී.

- විශේෂ තැන්පතු ගිණුම්වල නම් කරන ලද කල්පිරීමේ දිනය ඉක්මවීමෙන් පසුව ද සාමාන්‍ය කාලීන තැන්පතු ලෙස විශේෂ තැන්පතු ගිණුම් නමින්, විශේෂ තැන්පතු ගිණුම් හිමියා ආමුඛ ආයෝජන ගිණුම් (IIAs) හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම් (PCFAs) විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විට දී විශේෂ තැන්පතු ගිණුම්වලට ලද පොලිය ඇතුළු කල්පිරීමේ දී ලද මුදල් එම ගිණුම්වලට මාරු කිරීමට පහසුකම් සලසන තුරු, පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන්ට දන්වමින් 2020 අංක 09 දරන විධානය නිකුත් කරන ලදී.

## මිල සංශෝධන

අයිතම කිහිපයක උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.01.29 | ඉවත දැමිය හැකි මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 15ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | ඉවත දැමිය හැකි ශල්‍ය මුහුණු ආවරණ - නොවියන ලද (ලූපය සහිත හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 15ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | මුහුණු ආවරණ (එන් 95 වර්ගය - අංශු ශ්වසන පෙරණය) | ඒකකයකට රුපියල් 150ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.02.23 | බොම්බයි ළූණු | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 78ක සිට රුපියල් 190ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2020.03.12 | බ්‍රොයිලර් කුකුල් මස් (සම්පූර්ණ කුකුලකු) සම සහිත | කිලෝග්‍රෑමයට රුපියල් 430ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | බ්‍රොයිලර් කුකුල් මස් (සම්පූර්ණ කුකුලකු) සම රහිත | කිලෝග්‍රෑමයට රුපියල් 500ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | බඩ ඉරිඟු (ඕනෑම කාර්යයක් සඳහා භාවිතා කරන) | කිලෝග්‍රෑමයට රුපියල් 55ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.03.16 | පහත සඳහන් වෛද්‍ය උපකරණ සඳහා 2020 ජනවාරි 29 වන දින පනවන ලද උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී. | |
| | ඉවත දැමිය හැකි මුහුණු ආවරණ - ස්ථර තුනක් සහිත - නොවියන ලද (ලූපය හෝ ගැට ගසන) | ඒකකයකට රුපියල් 50ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | මුහුණු ආවරණ - එන් 95 වර්ගය (ශල්‍ය/සෞඛ්‍ය රක්ෂිත/ශ්වසන/වෛද්‍ය) | ඒකකයකට රුපියල් 325ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.03.18 | මයිසූර් පරිප්පු | කිලෝග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 130ක සිට රුපියල් 65ක් දක්වා පහළ දමන ලදී. |
| | බොම්බයි ළූණු | කිලෝග්‍රෑමයක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 190ක සිට රුපියල් 150ක් දක්වා පහළ දමන ලදී. |
| | ටින් මාළු | ශුද්ධ බර ග්‍රෑම් 425ක් සඳහා වූ උපරිම සිල්ලර මිල රුපියල් 140ක සිට රුපියල් 100ක් දක්වා පහළ දමන ලදී. |
| 2020.03.20 | 2020 ජනවාරි 29 වන දින පනවන ලද, 2020 මාර්තු 16 වන දින සංශෝධිත, වෛද්‍ය උපකරණ සඳහා වන උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී. | |
| 2020.04.10 | කීරි සම්බා | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 125ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 98ක සිට රුපියල් 90ක් දක්වා අඩු කරන ලදී. |
| | සුදු/රතු කැකුළු සම්බා | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 90ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් හා අට්ටික්කාරි හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 98ක සිට රුපියල් 90ක් දක්වා අඩු කරන ලදී. |
| | සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 85ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.04.21 | කහ කුඩු | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 750ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.04.28 | සුදු සීනි (ඇසුරුම් නොකළ) | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 100ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| | සුදු සීනි (ඇසුරුම් කළ) | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 105ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| 2020.04.30 | මයිසූර් පරිප්පු | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 65ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| | ටින් මාළු | ශුද්ධ බර ග්‍රෑම් 425ක් සඳහා වූ රුපියල් 100ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| 2020.05.28 | කීරි සම්බා | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 125ක සිට රුපියල් 120ක් දක්වා අඩු කරන ලදී. |
| | සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සූදුරු සම්බා හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 90ක සිට රුපියල් 98ක් දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු කැකුළු සම්බා | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 90ක සිට රුපියල් 98ක් දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් හා අට්ටික්කාරි හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 90ක සිට රුපියල් 96ක් දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 85ක සිට රුපියල් 93ක් දක්වා ඉහළ නංවන ලදී. |
| 2020.07.29 | ඩෙංගු සඳහා වන NS1 ප්‍රතිදේහජනක පරීක්ෂණය | එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 1,200ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | පූර්ණ රුධිර ගණන පරීක්ෂණය | එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 400ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2020.09.23 | කහ කුඩු | කිලෝග්‍රෑමයක් සඳහා වූ රුපියල් 750ක උපරිම සිල්ලර මිල ඉවත් කරන ලදී. |
| 2020.09.25 | වට ප්‍රමාණය අඟල් 13ට වැඩි පොල් | පොල් ගෙඩියකට රුපියල් 70ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | වට ප්‍රමාණය අඟල් 12-13 අතර පොල් | පොල් ගෙඩියකට රුපියල් 65ක උපරිම සිල්ලර මිලක පනවන ලදී. |
| | වට ප්‍රමාණය අඟල් 12ට අඩු පොල් | පොල් ගෙඩියකට රුපියල් 60ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |

# බදු සංශෝධන

## ආදායම් බදු

### පුද්ගල සහ සංස්ථාපිත ආදායම් බදු

2020 ජනවාරි 01 - පුද්ගල ආදායම් බදු අනුපාතික, බදු කාණ්ඩ සහ බදු නිදහස් සීමාව පහත පරිදි සංශෝධනය කරන ලදී.

| පැවති තත්ත්වය | | වර්තමාන තත්ත්වය | |
|---|---|---|---|
| බදු නිදහස් සීමාව | | | |
| සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 1.2ක් සහ පුද්ගල ආදායම සඳහා වාර්ෂිකව රුපියල් 500,000ක් | | ඕනෑම ආදායමක් සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 3ක් | |
| බදු අය කළ හැකි ආදායම | | | |
| බදු කාණ්ඩය | බදු අනුපාතිකය | බදු කාණ්ඩය | බදු අනුපාතිකය |
| පළමු රු. 600,000 | 4 | පළමු රු. 3,000,000 | 6 |
| රු. 600,001 - රු. 1,200,000 | 8 | රු. 3,000,001 - රු. 6,000,000 | 12 |
| රු. 1,200,001 - රු. 1,800,000 | 12 | රු. 6,000,000 ඉක්මවන | 18 |
| රු. 1,800,001 - රු. 2,400,000 | 16 | | |
| රු. 2,400,001 - රු. 3,000,000 | 20 | | |
| රු. 3,000,000 ඉක්මවන | 24 | | |

- 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි සංස්ථාපිත ආදායම් බදු අනුපාතික පහත පරිදි සංශෝධනය කරන ලදී.
  - සම්මත සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28 සිට සියයට 24 දක්වා අඩු කරන ලදී.
  - ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අදාළ වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 28 සිට සියයට 14 දක්වා අඩු කරන ලදී.
  - නිෂ්පාදන කර්මාන්තය සඳහා වන සංස්ථාපිත ආදායම් බදු අනුපාතිකය සියයට 18ක් ලෙස සංශෝධනය කරන ලදී.

### උපයන විට ගෙවීමේ බද්ද

2020 ජනවාරි 01 - ඕනෑම නේවාසික හෝ අනේවාසික පුද්ගලයකුගේ සේවා නියුක්ති ආදායම් මත අය කරන ලද උපයන විට ගෙවීමේ බද්ද ඉවත් කරන ලදී.

### අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද

2020 අප්‍රේල් 01 - විකල්ප පදනම මත, උපයන විට ගෙවීමේ බද්ද වෙනුවට අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හඳුන්වා දෙන ලදී. වාර්ෂික ආදායම රුපියල් මිලියන 3.0 ඉක්මවන සේවා නියුක්තිකයන්, රුපියල් මිලියන 3.0කින් යුත් එක් එක් බදු කාණ්ඩය සඳහා සියයට 6.0 සහ සියයට 12.0 යන අනුපාතයන් යටතේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගෙවීමට බැඳී සිටින අතර,

ආදායම රුපියල් මිලියන 9.0ක් ඉක්ම වූ විට අදාළ වන බදු අනුපාතිකය සියයට 18.0කි. නේවාසික සේවා නියුක්තිකයන්ගේ[3] කැමැත්ත ඇතිව ඔවුන්ගේ වේතනයෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලබන අතර, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද ගෙවීමට එකඟ නොවන ඕනෑම නේවාසික සේවා නියුක්තිකයෙකු අදාළ බදු කාණ්ඩ සහ අනුපාත මත පදනම්ව පුද්ගල ආදායම් බදු ගෙවීමට බැඳී සිටී. අනේවාසික සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් ගත්විට, එවැනි සේවා නියුක්තිකයන්ගේ කැමැත්ත නොතකා අදාළ සේවායෝජකයා විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද වේතනයෙන් අඩු කරනු ලැබේ.

## රඳවා ගැනීමේ බදු

2020 ජනවාරි 01 - පහත සඳහන් අවස්ථා හැර ඕනෑම නේවාසික පුද්ගලයකුට කරන ලද ඕනෑම ගෙවීමක් මත අය කරනු ලැබූ රඳවා ගැනීමේ බදු ඉවත් කරන ලදී.

- ලොතරැයි, ත්‍යාග, ඔට්ටු ඇල්ලීම හෝ සූදු ජයග්‍රහණ සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණ මත වූ සියයට 14ක රඳවා ගැනීමේ බද්ද
- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් පවත්වන ලද වෙන්දේසියක දී ඕනෑම මැණික් වර්ගයක් විකිණීම මත වූ සියයට 2.5ක රඳවා ගැනීමේ බද්ද
- 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 සහ 85 වගන්ති යටතේ, ඕනෑම අනේවාසිකයකුට සිදු කරන ගෙවීම් මත වූ රඳවා ගැනීමේ බද්ද

2020 මාර්තු 31 - 2020 පෙබරවාරි සහ මාර්තු මාසවලට අදාළ, 2020 මාර්තු 15 සහ 2020 අප්‍රේල් 15 වන දිනවලට ගෙවීමට නියමිතව තිබූ රඳවා ගැනීමේ බදු ගෙවීම් සඳහා නියමිත කාලය 2020 අප්‍රේල් 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී.

## ආර්ථික සේවා ගාස්තුව

2020 ජනවාරි 01 - 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තුව ඉවත් කරන ලදී.

## ආදායම් බදු නිදහස් කිරීම්

2020 ජනවාරි 01

- තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා මත උපයන ලාභ සහ ආදායම
- යම් සේවාවන් සඳහා වන ගෙවීම් බැංකුවක් හරහා විදේශ මුදල්වලින් ලැබෙන්නේ නම්, විදේශ ප්‍රභවයන්ගෙන් උපයන ආදායම ද ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයින්ට සපයනු ලබන සේවාවන් සඳහා ලැබෙන ලාභය සහ ආදායම
- අනේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම් හෝ නේවාසික විදේශීය ව්‍යවහාර ගිණුම්වලින් උපයන පොලී ආදායම
- නේවාසික සමාගමක් විසින් ඕනෑම අනේවාසිකයකුට ගෙවන ලාභාංශ
- වාණිජ කේන්ද්‍රීය මෙහෙයුම්කරුවන් විසින් බෙදා හරිනු ලබන ලාභාංශ
- රසායනාගාර සේවා හෝ ප්‍රමිති සහතික කිරීමේ සේවාවන්ගෙන් ඕනෑම අනේවාසිකයකු විසින් ලබා ගත් මුදල්
- ප්‍රදාන සහ පරිත්‍යාග ලෙස ඕනෑම ආගමික ආයතනයකට ලැබෙන මුදල්

3 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුව

## එකතු කළ අගය මත බදු

2020 ජනවාරි 01 - එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව වාර්ෂිකව රුපියල් මිලියන 12ක සිට වාර්ෂිකව රුපියල් මිලියන 300ක් දක්වා ඉහළ නංවන ලදී.

- තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.

2020 මාර්තු 23 - 2020 පෙබරවාරි සහ මාර්තු මාසවලට අදාළ, 2020 මාර්තු 20 සහ 2020 අප්‍රේල් 20 වන දිනවලට ගෙවීමට නියමිතව තිබූ එකතු කළ අගය මත බදු ගෙවීම් සඳහා නියමිත කාලය 2020 අප්‍රේල් 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී.

## නිෂ්පාදන/සුරා බදු

2020 අප්‍රේල් 30 - ඊතයිල් මද්‍යසාර සඳහා වන සුරා බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| අයිතමය | මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය | පෙර පැවති බද්ද 2016.03.02 වන දින සිට බලපැවැත්වෙන පරිදි (තොග ලීටරයට රුපියල්) | | බදු සංශෝධනය 2020.04.30 වන දින සිට බලපැවැත්වෙන පරිදි (තොග ලීටරයට රුපියල්) | |
|---|---|---|---|---|---|
| | | දේශීයව සපයනු ලබන | ආනයනික | දේශීයව සපයනු ලබන | ආනයනික |
| රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 10,000 දක්වා<br>සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය සඳහා ලීටර් 20,000 දක්වා | නිදහස් | නිදහස් | නිදහස් | නිදහස් |
| | ලීටර් 10,001 සිට 20,000 දක්වා | 600 | 700 | | 700 |
| | ලීටර් 20,000 ට වැඩි | 1,000 | 1,100 | | 1,100 |
| අවසන් නිපැයුම් සුරාබදු ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 500 දක්වා | නිදහස් | 200 | නිදහස් | 2,00 |
| | ලීටර් 501 සිට 10,000 දක්වා | 600 | 700 | 100 | 700 |
| | ලීටර් 10,001 සිට 20,000 දක්වා | 700 | 800 | 150 | 800 |
| | ලීටර් 20,000 ට වැඩි | 1,100 | 1,200 | 200 | 1,200 |
| අවසන් නිපැයුම් සුරාබදු ගෙවීමට යටත් නොවන, අපනයන නිපැයුම් නිෂ්පාදනය සඳහා හෝ එවැනි අපනයන නිෂ්පාදන සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සේදීම සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 500 දක්වා | නිදහස් | නිදහස් | නිදහස් | නිදහස් |
| | ලීටර් 501 සිට 10,000 දක්වා | 600 | 700 | 100 | 700 |
| | ලීටර් 10,001 සිට 20,000 දක්වා | 700 | 800 | 150 | 800 |
| | ලීටර් 20,000 ට වැඩි | 1,100 | 1,200 | 200 | 1,200 |
| අශුද්ධ ඊතයිල් මද්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/දුර්වල ස්ප්‍රීතු සඳහා) | සෑම ලීටරයකටම | 400 | 1,100 | 75 | 1,100 |
| මද්‍යසාර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඊතයිල් මද්‍යසාර සඳහා වන බද්ද | සෑම ලීටරයකටම | 10 | 10 | 10 | 10 |

2020 ජූනි 09 - ඊතයිල් මද්‍යසාර සඳහා වන සුරා බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| අයිතමය | මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය | බදු සංශෝධනය (තොග ලීටරයට රුපියල්) | |
|---|---|---|---|
| | | දේශීයව සපයනු ලබන | ආනයනික |
| අවසන් නිපැයුම් සුරාබදු ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර (සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා යොදා ගන්නා ඊතයිල් මද්‍යසාර හැර) | ලීටර් 500 දක්වා | නිදහස් | 200 |
| | ලීටර් 501 සිට 10,000 දක්වා | 100 | 700 |
| | ලීටර් 10,001 සිට 20,000 දක්වා | 150 | 800 |
| | ලීටර් 20,000 ට වැඩි | 200 | 1,200 |
| නිෂ්පාදනයන් සඳහා භාවිතා වන ඊතයිල් මද්‍යසාර; | | | |
| 2020.03.30 සිට 2020.08.15 දක්වා කාලය තුළ දේශීය අලෙවිය සඳහා වන සනීපාරක්ෂක නිෂ්පාදනයන්ට යොදා ගැනීම | ලීටර් 500 දක්වා | නිදහස් | 200 |
| | ලීටර් 501 සිට 10,000 දක්වා | | 700 |
| | ලීටර් 10,001 සිට 20,000 දක්වා | | 800 |
| | ලීටර් 20,000 ට වැඩි | | 1,200 |
| අපනයනය සඳහා වන සනීපාරක්ෂක නිෂ්පාදන | සෑම ලීටරයටම | නිදහස් | 25 |

## නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද

2020 ජූනි 09 - පාම් තෙල් මේද අම්ල සහ ටැලෝ මේද අම්ල සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 20 සිට සියයට 24ක් දක්වා වැඩි කරන ලදී.

තෝරාගත් පැණිරස කාරක පාන වර්ග සඳහා වන නිෂ්පාදන බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී:

| අයිතමය | පැවති බද්ද 2019.03.06 සිට බලපැවැත්වෙන පරිදි | බදු සංශෝධනය 2020.08.22 සිට බලපැවැත්වෙන පරිදි |
|---|---|---|
| සීනි හෝ වෙනත් පැණිරස කාරක ද්‍රව්‍යයන් එකතු කරනු ලැබුවා වූ හෝ රස කළා වූ, ඛනිජ ජලය හා වායුව කවනු ලැබුවා වූ (එරේටඩ්) ජලය ඇතුළු ජල වර්ග | ලීටරයට රුපියල් 12ක හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 4ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40ක් යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30 යන දෙකෙන් වැඩි අගය |
| "ශක්ති ජනක පාන" ලෙස අලෙවි වන පාන වර්ග | ලීටරයට රුපියල් 12 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 4ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40 යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 6ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30 යන දෙකෙන් වැඩි අගය |
| පලතුරු හෝ එළවළු යුෂ පාදක කර ගත් පානයන් - මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | ලීටරයට රුපියල් 12 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40 යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 9ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30 යන දෙකෙන් වැඩි අගය |
| අනෙකුත් - මිලි ලීටර 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් | ලීටරයට රුපියල් 12 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 8ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 40 යන දෙකෙන් වැඩි අගය | ලීටරයට රුපියල් 12 හෝ නිෂ්පාදිතයේ අඩංගු සීනි, මිලි ලීටර 100කට ග්‍රෑම් 9ක් ඉවත් කරමින්, ග්‍රෑමයකට ශත 30 යන දෙකෙන් වැඩි අගය |

## ආනයන තීරු බදු

පෙට්‍රල් හා ඩීසල් ආනයනය සඳහා වන ආනයන තීරු බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| වර්ගය | දිනය | ආනයන තීරු බද්ද (ලීටරයට රුපියල්) | ආනයන තීරු බදු සහනය (ලීටරයට රුපියල්) | අදාළ තීරු බද්ද (ලීටරයට රුපියල්) | අධිභාරය (ආනයන තීරු බද්දේ ප්‍රතිශතයක් ලෙස) (ලීටරයට රුපියල්) |
|---|---|---|---|---|---|
| පෙට්‍රල් (92 ඔක්ටේන්) | 2019.09.11 | 35.00 | 17.00 | 18.00 | - |
| | 2020.03.14 | 35.00 | 5.00 | 30.00 | - |
| | 2020.04.23 | 50.00 | - | 50.00 | 26.00 (අ) |
| | 2020.06.30 | 50.00 | 6.00 | 44.00 | - |
| | 2020.09.17 | 50.00 | 11.00 | 39.00 | - |
| පෙට්‍රල් (95 ඔක්ටේන්) | 2018.12.28 | 35.00 | - | 35.00 | - |
| | 2020.03.14 | 35.00 | - | 35.00 | 15.00 (අ) |
| | 2020.04.23 | 50.00 | - | 50.00 | 49.00 (අ) |
| | 2020.06.24 | 50.00 | - | 50.00 | 20.00 (අ) |
| | 2020.06.30 | 50.00 | 6.00 | 44.00 | - |
| | 2020.08.24 | 50.00 | 6.00 | 44.00 | 20.00 (ආ) |
| සුදු ඩීසල් | 2019.01.12 | 5.85 | 3.00 | 2.85 | - |
| | 2020.03.14 | 5.85 | - | 5.85 | 11.00 (අ) |
| | 2020.04.23 | 25.00 | - | 25.00 | 24.00 (අ) |
| | 2020.06.24 | 25.00 | - | 25.00 | 12.00 (අ) |
| | 2020.06.30 | 25.00 | 7.00 | 18.00 | - |
| | 2020.08.24 | 25.00 | 7.00 | 18.00 | 12.00 (ආ) |
| | 2020.09.17 | 25.00 | 8.00 | 17.00 | - |
| සුපිරි ඩීසල් | 2019.07.11 | 15.00 | - | 15.00 | - |
| | 2020.03.14 | 15.00 | - | 15.00 | 20.00 (අ) |
| | 2020.04.23 | 25.00 | - | 25.00 | 40.00 (අ) |
| | 2020.06.24 | 25.00 | - | 25.00 | 30.00 (අ) |
| | 2020.06.30 | 25.00 | 5.00 | 20.00 | - |
| | 2020.08.24 | 25.00 | 5.00 | 20.00 | 30.00 (ආ) |

(අ) මාස දෙකක කාලයක් සඳහා අදාළ වේ.

(ආ) මාස තුනක කාලයක් සඳහා අදාළ වේ.

2020 ජනවාරි 14 - කිරිගු පිටි සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 13ක බදු සහනයක් ලබා දෙන ලද අතර, ඒ සඳහා අදාළ වන බද්ද කිලෝ ග්‍රෑමයට රුපියල් 3කි.

2020 අප්‍රේල් 10 - මෝටර් වාහන සඳහා භාවිතා කරනු ලබන ආනයනික ලිහිසි තෙල් සඳහා අදාළ වන ආනයන තීරු බද්ද වැඩි කරන ලදී.

2020 අප්‍රේල් 17 - ආනයනික මාළු නිෂ්පාදන, ජමනාරං, ධාන්‍ය නිෂ්පාදන, පිටි, යුෂ නිෂ්පාදන ඇතුළු එළවළු සහ පලතුරු නිෂ්පාදන, තේ සහ කෝපි නිස්සාරක සහ දුම්කොළ නිෂ්පාදන සඳහා අදාළ වන ආනයන තීරු බද්ද සියයට 25-50 අතර පරාසයක් තුළ වැඩි කරන ලදී.

2020 ජූනි 19 - අන්තර් අමාත්‍යාංශ කාර්ය සාධක බලකාය (කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධනය සඳහා වූ) විසින් නිර්දේශ කරන ලද බදු සංශෝධන ක්‍රියාත්මක කරන ලදී.

- දුණු සහ දුණු සඳහා කොළ සඳහා වන ආනයන තීරු බද්ද වැඩි කරන ලදී.

2020 සැප්තැම්බර් 23 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහ පශු සම්පත්, ගොවිපළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ මත, දේශීය පශු සම්පත් ගොවීන්ට තණකොළ හෝ වෙනත් පැළෑටි වර්ග සපයනු ලබන නිෂ්පාදන ආයතනයක් විසින් ආනයනය කරනු ලබන රේඛීය අඩු ඝනත්ව පොලිතීන් සඳහා සියයට 15ක සාමාන්‍ය තීරු බදු අත් හැරීමක් ලබා දෙන ලදී.

## සෙස් බද්ද

2020 ජනවාරි 14 - තිරිඟු පිටි සඳහා වන කිලෝග්‍රෑමයට රුපියල් 15ක සෙස් බද්ද ඉවත් කරන ලදී.

2020 මැයි 20 - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ තිබෙන්නා වූ ඕනෑම අපනයන - අභිමුඛ ව්‍යවසායයන් මගින් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය සහ කොවිඩ්-19 මර්දන මධ්‍යස්ථානය (කොවිඩ්-19 ව්‍යාප්ති මර්දනය සඳහා වන ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය) වෙත සපයනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ සමාන අයිතම, ඔවුන්ගේ ඉල්ලීම මත සෙස් බද්දෙන් නිදහස් කරන ලදී.

- කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත ආනයනය, ආනයනය සහ සැපයීම සහ ආනයනය සහ පරිත්‍යාග කරනු ලබන වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, කොටස්, උපාංග සහ අමතර කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ උපකරණ සහ ඖෂධ, රසායනික ද්‍රව්‍ය සහ ඒ හා සමාන භාණ්ඩ සෙස් බද්දෙන් නිදහස් කරන ලදී. කොටස් වශයෙන් ආනයනික භාණ්ඩ සඳහා ඉහත බදු නිදහස් කිරීම අදාළ නොවන අතර, මෙම බදු නිදහස් කිරීම 2020 දෙසැම්බර් 31 දින දක්වා පමණක් වලංගු වේ.

2020 ජූනි 03/
2020 ජූලි 01 - පහත අයිතම සඳහා වන සෙස් බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| අයිතමය | පැවති බද්ද (සියයට) 2017.11.28 සිට බලපැවැත්වෙන පරිදි | බදු සංශෝධනය (කිලෝග්‍රෑමයට රුපියල්) 2020.06.03 සිට බලපැවැත්වෙන පරිදි | බදු සංශෝධනය (කිලෝග්‍රෑමයට රුපියල්) 2020.07.01 සිට බලපැවැත්වෙන පරිදි |
|---|---|---|---|
| සිමෙන්ති කැට (ක්ලින්කර්ස්) | - | 1.00 | - |
| පෝර්ට්ලන්ඩ් සිමෙන්ති: කෘතිම ලෙස වර්ණ ගැන්වූ හෝ නොගැන්වූ සුදු සිමෙන්ති | 8.0 | 3.00 | 2.00 |
| දිය කාන්දු නොවන සිමෙන්ති, බොයිලර් සිමෙන්ති සහ ඒවායේ සංයුතීක | 8.0 | 3.00 | 2.00 |
| කිලෝ ග්‍රෑම් 50 සහ ඊට අඩු ඇසුරුම්වලින් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 14.0 | 5.00 | 3.00 |
| කිලෝ ග්‍රෑම් 50 වැඩි ඇසුරුම්වලින් හෝ තොග වශයෙන් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | 8.0 | 3.00 | 2.00 |

2020 ජූලි 01 - තෝරාගත් භාණ්ඩ කිහිපයක් සඳහා ආනයනය මත සෙස් බද්දක් පනවන ලද අතර, තෝරාගත් භාණ්ඩ කිහිපයක් සඳහා ආනයනය මත වන සෙස් බද්ද ඉහළ නංවන ලදී.

## විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද[4]

ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.01.25 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.02.02 | බොම්බයි ළූණු, කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), ඇපල් (අලුත්). බඩ ඉරිඟු, එළවළු තෙල්, බීට් සහ උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.02.07 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී. |
| 2020.02.25 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දින 31ක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.03.04 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25ක සිට සියයට 10ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 150ක්, යන දෙකෙන් වැඩි අගය, දක්වා ඉහළ නංවන ලදී. |
| 2020.03.08 | මැකරල් මාළු, උඳු, කව්පි සහ කුරක්කන් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.03.13 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) - මත්ස්‍ය ඇම සඳහා භාවිතා කරන මාළු | ධීවර අමාත්‍යාංශයේ නිර්දේශයට යටත්ව, 2020 මාර්තු මස 04 වැනි දින හෝ ඊට පෙර නැව්ගත කර ඇති බවට නෞභාර පත මගින් සනාථ කෙරේ නම්, ආනයන සඳහා සියයට 10ක් හෝ කිලෝග්‍රෑමයකට රු. 150ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයකට රුපියල් 25ක් අය කරගෙන, ඉතිරි වටිනාකම බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2020.03.18 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත) | ධීවර අමාත්‍යාංශයේ නිර්දේශයට යටත්ව, 2020 මාර්තු මස 04 වැනි දින හෝ ඊට පෙර නැව්ගත කර ඇති බවට නෞභාර පත මගින් සනාථ කෙරේ නම්, ආනයන සඳහා සියයට 10ක් හෝ කිලෝග්‍රෑමයකට රු. 150ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයකට රුපියල් 25ක් අය කරගෙන, ඉතිරි වටිනාකම බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2020.03.19 | විෂබීජ නාශක සහ මුහුණු ආවරණ | කිලෝග්‍රෑමයට රුපියල් 1ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| 2020.03.27 | අර්තාපල් | කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |

4 2020 ඔක්තෝබර් 14 වන දින දක්වා සිදු කරන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු වෙනස් වීම් ඇතුළත් වේ.

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.04.10 | එළවළු තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී. |
| 2020.04.17 | දොඩම් (අලුත් සහ වියළි), මිදි (අලුත් සහ වියළි), ඇපල්, පෙයාර්ස්, චෙරීස් සහ ප්ලම්ස් හා ස්ලෝස් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස දෙකක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී. |
| 2020.04.17 | ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), මහසිදරන්, පොමෙලොස් ඇතුළුව (අලුත් සහ වියළි), ලෙමන් (අලුත් සහ වියළි), ක්වීන්සස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරීස් (ප්‍රෑනූස් සෙරාසස්) සහ නෙක්ටාරින්ස් ඇතුළු පීචස් | මාස දෙකක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනවන ලදී. |
| | පොල්තෙල් | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 295ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 195ක් දක්වා අඩු කරන ලදී. |
| 2020.05.01 | බොම්බයි ළූණු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියලේ සිට කිලෝග්‍රෑමයට රුපියල් 15ක් දක්වා වැඩි කරන ලදී. |
| 2020.05.08 | හාල්මැස්සන්, කරවල, මුං ඇට, මැංගුස්ටීන් (අලුත් සහ වියළි) සහ කිවිෆෲට් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.05.22 | යෝගට්, අර්තාපල්, රතු ළූණු, සුදු ළූණු, මෑ වර්ගයේ ඇට (පියලි කළ), කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), ලෙමන් (අලුත් සහ වියළි), මිදි (අලුත්), ඇපල් (අලුත්), ක්වීන්සස් (අලුත්), මිරිස් (වියළි, කුඩු නොකළ හෝ නොඇඹරූ) බඩඉරිඟු, රටකජු (පොතු හරින ලද), පොල්තෙල් හැර එළවළු තෙල්, මාජරින්, ටින් මාළු, බීට් සහ උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | දොඩම් (වියළි), මිදි (වියළි), සහ පොල්තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | ජැක් සහ හෝස් මැකරල් මාළු | කිලෝග්‍රෑමයට රුපියල් 150ක් හෝ සියයට 10ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 6ක් දක්වා අඩු කරන ලදී. |
| | මෑ වර්ගයේ ඇට (සම්පූර්ණ), මිරිස් (කුඩු කළ හෝ ඇඹරූ), සූදුරු බීජ, මහදුරු බීජ සහ මුහුණු ආවරණ | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.06.17 | ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් සහ මාජරින් (අනෙකුත්) | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 600ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී. |
| | ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), මහසිදරන්, පොමෙලොස් ඇතුළුව (අලුත් සහ වියළි), පෙයාර්ස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරීස් (ප්‍රෑනූස් සෙරාසස්), චෙරීස් (අනෙකුත්), නෙක්ටාරීන් ඇතුළු පීචස්, ප්ලම්ස් සහ ස්ලෝස් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.06.27 | එළවළු තෙල් (පොල්තෙල් හැර), ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් සහ මාජරින් (අනෙකුත්) | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී. |
| | පොල්තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී. |

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2020.07.11 | පොල්තෙල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අඩු කරන ලදී. |
| 2020.07.19 | උම්බලකඩ, පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, කොත්තමල්ලි බීජ, කහ (කුඩු නොකළ හෝ නොඇඹරූ සහ අනෙකුත්) | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | උඳු පිටි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 200ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 325ක් දක්වා වැඩි කරන ලදී. |
| 2020.08.01 | හාල්මැස්සන්, කරවල, මුං ඇට, මැංගුස්ටීන් (අලුත් සහ වියළි) සහ කිව්ෆෲට් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | බොම්බයි ළූණු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 50ක් දක්වා වැඩි කරන ලදී. |
| 2020.08.15 | අර්තාපල් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 50ක සිට කිලෝග්‍රෑමයට රුපියල් 55ක් දක්වා වැඩි කරන ලදී. |
| 2020.08.22 | ජැක් සහ හෝස් මැකරල් මාළු | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 6ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කරන ලදී. |
| 2020.09.04 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත), මැකරල්, ජැක් සහ හෝස් මැකරල් මාළු, උඳු, කව්පි සහ කුරක්කන් | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.10.01 | වෙඩරු, කිරිවලින් නිපදවූ තැවරුම්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, අබ ඇට සහ ලුණු | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2020.10.14 | බොම්බයි ළූණු, රතු පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), ටින් මාළු, බීට් සහ උක් සීනි, සුදු ස්ඵටිකකෘත උක් සීනි සහ සුදු ස්ඵටිකකෘත බීට් සීනි | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට ශත 25ක් දක්වා අඩු කරන ලදී. |

## වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

2020 පෙබරවාරි 25 - සිමෙන්ති කැට (ක්ලින්කර්) සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 10ක සිට සියයට 7.5ක් දක්වා අඩු කරන ලදී.

2020 අප්‍රේල් 16 - සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත පරිත්‍යාගයක් ලෙස භාර දී ඇති, සෞඛ්‍ය උපකරණ හා උපාංග සහ රෝහල් ගෘහ උපකරණ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

2020 අප්‍රේල් 23 - වානේ කර්මාන්තය සඳහා අදාළ වන අමුද්‍රව්‍ය ආනයනය සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 10ක සිට සියයට 5ක් දක්වා අඩු කරන ලදී.

2020 මැයි 19 - සුදුසුකම් ලත් ඕනෑම අපනයන අභිමුඛ - ව්‍යවසායයන් මගින් සපයනු ලබන හෝ ප්‍රදානය කරනු ලබන සෞඛ්‍ය ආරක්ෂණ උපකරණ සහ ඒ හා සමාන අයිතම වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී.

- කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත ආනයනය, ආනයනය සහ සැපයීම, ආනයනය සහ පරිත්‍යාග කරනු ලබන වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය හා දන්ත වෛද්‍ය උපකරණ, කොටස්, උපාංග සහ අමතර කොටස්, රෝහල්/වෛද්‍ය ගෘහ උපකරණ සහ ඖෂධ, රසායනික ද්‍රව්‍ය හා ඒ හා සමාන භාණ්ඩ

| | | |
|---|---|---|
| | | වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. කොටස් වශයෙන් ආනයනික භාණ්ඩ සඳහා ඉහත බදු නිදහස් කිරීම් අදාළ නොවන අතර මෙම බදු නිදහස් කිරීම 2020 දෙසැම්බර් 31 දින දක්වා පමණක් වලංගු වේ. |
| 2020 මැයි 26 | - | ඖෂධ නිෂ්පාදකයන් විසින් ඖෂධ නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍ය වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2020 සැප්තැම්බර් 03 | - | තෝරාගත් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය සඳහා අදාළ වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 5ක සිට සියයට 2.5ක් දක්වා අඩු කරන ලදී. |

## අනෙකුත් බදු සහ අයබදු

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 01 | - | ණය ආපසු ගෙවීමේ බද්ද ඉවත් කරන ලදී. |
| 2020 මාර්තු 23 | - | 2020 පළමු කාර්තුවට අදාළව, 2020 අප්‍රේල් 15 වන දිනට ගෙවීමට නියමිතව තිබූ මුද්දර ගාස්තු ගෙවීම් 2020 අප්‍රේල් 30 දින දක්වා සිදු කිරීමට අවසර ලබා දෙන ලදී. |

## රාජ්‍ය වියදම

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 08 | - | 2020 යල කන්නය ආරම්භයේ සිට වී වගා කරන ගොවීන් සඳහා, උපරිමය හෙක්ටයාර 02කට යටත්ව, යූරියා, ත්‍රිත්ව සුපිරි පොස්පේට් (T.S.P.) සහ මියුරේට් ඔෆ් පොටෑෂ් (MoP) යන පොහොර වර්ගවල නිර්දේශිත ප්‍රමාණයන් නොමිලේ ලබා දීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දෙන ලදී. |
| 2020 පෙබරවාරි 14 | - | ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් හා සහාය දීම සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාව පිහිටුවන ලදී. |
| 2020 ජූනි 19 | - | 2020 මැයි 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි, රාජ්‍ය සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව අවුරුදු හැට එකක් (61) දක්වා දීර්ඝ කරන ලදී. |
| 2020 අගෝස්තු 28 | - | 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා වන කාලය සඳහා රුපියල් බිලියන 1,748ක අතුරු සම්මත ගිණුමක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. |
| 2020 සැප්තැම්බර් 02 | - | උපාධිධාරීන් සහ අඩු ආදායම්ලාභී පවුල්වලින් නුපුහුණු පුද්ගලයින් බඳවා ගැනීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. |
| 2020 සැප්තැම්බර් 11 | - | රජය සතු වාණිජ ව්‍යාවසායයන් විසින් සිදු කරනු ලබන අනුග්‍රහ දැක්වීම්, පරිත්‍යාග කිරීම් සහ දැන්වීම් පළ කිරීම් වැනි ආයතනික සමාජ වගකීම් පිළිබඳ ක්‍රියාකාරකම් සඳහා පනවා තිබූ තාවකාලික තහනම ඉවත් කරන ලදී. |

## රාජ්‍ය ණය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2020 ජනවාරි 01 | - | රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළෙහි සිදු කරනු ලබන ගනුදෙනුවල වැඩි තොරතුරු ප්‍රමාණයක් ග්‍රහණය කර ගැනීම සඳහා නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියේ (Scripless Securities Settlement System) ගනුදෙනුවලට අදාළ තොරතුරු (පියවීමේ වටිනාකම, මිල සහ පොලී අනුපාතිකය ඇතුළුව) වාර්තා කිරීමට පියවර ගන්නා ලදී. |
| 2020 මාර්තු 29 | - | සතිපතා සිදුවන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දී පැන නගින හිඟතාවයන් මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමට පියවර ගන්නා ලදී. |
| 2020 මැයි 06 | - | මූල්‍ය වෙළඳපොළ නැවත යථා තත්ත්වයට පත්වන තෙක් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා ඉදිරිපත් කරන එක් එක් කල්පිරීම් සඳහා පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකයන් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගන්නා ලදී. |
| | - | වෙළඳපොළ යථා තත්ත්වයට පත්වී, වෙන්දේසි හා සම්බන්ධ සාමාන්‍ය ක්‍රියා පටිපාටි නැවත ක්‍රියාත්මක කරන තෙක්, භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි ක්‍රමයේ තුන්වන අදියර (Phase III) සක්‍රිය කිරීම තාවකාලිකව නවතා දමන ලදී. |